05
පාඩම
पञ्चमः पाठः ।

# अस्ति कश्चिद्वाग्विशेषः ?

## වර්තමාන කාලය ලට් (පරස්මෛපද)

වර්තමාන කාලය සඳහා සංස්කෘත භාෂාවෙහි ඇති එක ම විභක්තිය මෙය යි. දැන් සිදුවන ක්‍රියා වර්තමාන ක්‍රියා නමින් හැඳින් වේ. සංස්කෘත භාෂාවේ 'ලට්' ලකාරයෙන් දැක්වෙන්නේ වර්තමාන ක්‍රියාපදයි.

### ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

| | एक | द्वि | बहु | एक | द्वि | बहु |
|---|---|---|---|---|---|---|
| प्रथम | ति | तः | न्ति | पठति | पठतः | पठन्ति |
| मध्यम | सि | थः | थ | पठसि | पठथः | पठथ |
| उत्तम | मि | वः | मः | पठामि | पठावः | पठामः |

### එහි සිංහල අර්ථය

| පුරුෂ | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| ප්‍රථමපුරුෂ | පාඩම් කරයි | (දෙදෙන) පාඩම් කරත් | පාඩම් කරති |
| මධ්‍යමපුරුෂ | පාඩම් කරහි | (දෙදෙන) පාඩම් කරහු | පාඩම් කරහු |
| උත්තමපුරුෂ | පාඩම් කරමි | (දෙදෙන) පාඩම් කරමු | පාඩම් කරමු |

## වර්තමාන කාලය ලට් (ආත්මනේපද)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

| | एक | द्वि | बहु | एक | द्वि | बहु |
|---|---|---|---|---|---|---|
| प्रथम | ते | एते | न्ते | भाषते | भाषेते | भाषन्ते |
| मध्यम | से | एथे | ध्वे | भाषसे | भाषेथे | भाषध्वे |
| उत्तम | ए | वहे | महे | भाषे | भाषावहे | भाषामहे |

පරස්මෛපදයෙහි හා ආත්මනේපදයෙහි ආඛ්‍යාතයන් යෙදෙන නොයෙදෙන ආකාරය හඳුනා ගනිමු.

१. बालिका ओदनं पचति । / बालिका भक्तं पचते । (ගැහැණු ළමයා බත් උයයි.)

२. याचकः अन्नं याचति । / याचकः अन्नं याचते । (යාචකයා කෑම ඉල්ලයි.)

३. छात्रः गृहकार्यं करोति । / छात्रः गृहकार्यं कुरुते । (සිසුවා ගෙදර වැඩ කරයි.)

| | | | |
|---|---|---|---|
| पच् | > | पचति । / पचते । | (පිසයි) |
| लिख् | > | लिखति । ~~लिखते ।~~ | (ලියයි) |
| चल् | > | चलति । ~~चलते ।~~ | (ඇවිදියි) |
| याच् | > | याचति । / याचते । | (ඉල්ලයි) |
| पठ् | > | पठति । ~~पठते ।~~ | (හදාරයි) |
| लभ् | > | ~~लभति ।~~ लभते । | (ලබයි) |

## ක්‍රියාකාරකම 01

01. ඉහතින් දැක්වුණු ලට් ලකාරයට අනුව පහත ක්‍රියාපද වරනගමු.

| | | | |
|---|---|---|---|
| अटति -<br>ඇවිදියි | अस्यति -<br>විසිකරයි | इच्छति -<br>කැමතිවෙයි | कथयति -<br>කියයි |
| चलति -<br>සෙලවෙයි | क्षाम्यति -<br>කමාකරයි | कृन्तति -<br>කපයි | पूजयति -<br>පුදයි |
| जीवति -<br>ජීවත්වෙයි | नश्यति -<br>නැසෙයි | क्षिपति -<br>විසිකරයි | छादयति -<br>සඟවයි |
| रक्षति -<br>රකියි | शाम्यति -<br>සංසිඳෙයි | लिम्पति -<br>පාටකරයි | भूषयति -<br>සරසයි |
| व्रजति -<br>යයි | शुष्यति -<br>වියළෙයි | विशति -<br>පිවිසෙයි | प्रीणयति -<br>පිණවයි |
| शंसति -<br>පසසයි | नृत्यति -<br>නටයි | सिञ्चति -<br>ඉසියි | क्षालयति -<br>සෝදයි |
| चुम्बति -<br>සිඹියි | श्रुणोति -<br>අසයි | सृजति -<br>මවයි | पृच्छति -<br>විචාරයි |
| जल्पति -<br>දොඩමළුවෙයි | मुष्णाति -<br>සොරකම් කරයි | वर्णयति -<br>වර්ණනා කරයි | पालयति -<br>පාලනය කරයි |
| पुनाति -<br>පවිත්‍ර කරයි | गृह्णाति -<br>ගණියි | जानाति -<br>දනියි | बध्नाति -<br>බඳියි |
| प्रीणाति -<br>පිණවයි | लुनाति -<br>සිඳියි | करोति -<br>කරයි | अश्नाति -<br>අනුභව කරයි |

## අභ්‍යාසය 01

01. ඡේදයේ වරහන් තුළ ඇති සිංහල ක්‍රියාපදයට අනුව ලට් ලකාර ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

### मम विद्यालयः।

मम विद्यालयः अतिविशालः। अस्माकं विद्यालये सहस्रं छात्राः पठन्ति। तत्र ते परस्परम् आनन्देन ................। (मिल् - හමුවෙත්) छात्राः पुस्तकानि लेखन्याः च विद्यालयं................। (नय् - ගෙනයත්) आदौ छात्राः बुद्धवन्दनं कुर्वन्ति गुरुं च ................। (प्र + नम् - වදිත්) ततः अध्यापकः विविधान् विषयान् फलके ................। (लिख् - ලියත්) शतं अद्यापकाः अद्यापिका च कार्यं ................। (कृ - කරත්) अस्माकं विद्यालये विशालं क्रीडाक्षेत्रम् ................। (अस् - ඇත) ते क्रीडाक्षेत्रे क्रीडन्ति। केचित् छात्राः कन्दुकेन ................। (क्रीड् - ක්‍රීඩාකරත්) अन्ये धावन्ति अपरे च ................। (उत् + पत् - උඩපනිත්) अध्यापकाः च मार्गदर्शनं कुर्वन्ति। अस्माकं विद्यालये विशालः पुस्तकालयः अपि अस्ति। तत्र ते तूष्णीम् ................। (पठ् - ඉගෙනගනිත්) अस्माकं विद्यालये उपवनम् अस्ति। तत्र अनेकानि पुष्पाणि ................। (अस् - වෙත්) मालाकारः उपवनं................। (रक्ष् - රකී) वयम् उपवने अन्यैः छात्रैः सह पाठं ................। (पठ् - පාඩම් කරමු) व्यायामः कुर्मः क्रीडामः च।

## අභ්‍යාසය 02

01. හිස්තැන් පුරවන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | ඒක වචන | ද්විවචන | බහු වචන |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | करोति | | | කරයි | | |
| मध्यमपुरुष | | कुरुथः | | | දෙදෙනෙක් කරහු | |
| उत्तमपुरुष | | | कुर्मः | | | කරමු |

## අභ්‍යාසය 03

01. පහත දැක්වෙන ක්‍රියාපදවල පුරුෂය, වචනය හා තේරුම ලියන්න.

| | | පුරුෂය | වචනය | තේරුම |
|---|---|---|---|---|
| १. गच्छति | - | प्रथम | एक | යයි |
| २. यच्छन्ति | - | .................. | .................. | .................. |
| ३. जयसि | - | .................. | .................. | .................. |
| ४. दशतः | - | .................. | .................. | .................. |
| ५. जिघ्रामः | - | .................. | .................. | .................. |
| ६. विशतः | - | .................. | .................. | .................. |
| ७. हरथः | - | .................. | .................. | .................. |
| ८. गायामि | - | .................. | .................. | .................. |
| ९. कर्षावः | - | .................. | .................. | .................. |
| १०. राजन्ति | - | .................. | .................. | .................. |

## අභ්‍යාසය 04

01. ලට් ආත්මනේපද ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | लभते | | | | वर्धते | | |
| मध्यमपुरुष | | लभेथे | | | | | वर्धध्वे |
| उत्तमपुरुष | | | लभामहे | | | वर्धावहे | |

## අභ්‍යාසය 05

01. ලට් ආත්මනේ ක්‍රියාපද යොදා හිස්තැන් පුරවන්න.

१. दरिद्रः कष्टं ………….. । सह् - (දිළින්දා දුක් උසුලයි.)

२. वृक्षः वातेन ………….. । कम्प् - (ගස සුළඟින් සෙලවෙයි.)

३. कीटः सस्यं ………….. । बाध् - (පණුවා ගොයමට බාධා කරයි.)

४. छात्रौ श्लोकं ………….. । भाष् - (ශිෂ්‍යයෝ දෙදෙනා ශ්ලෝකයක් කියත්.)

५. आचार्यः चतुरान् छात्रान्………….. । सेव् - (ගුරුවරයා දක්ෂ සිසුන් ඇසුරු කරයි.)

### අතීතකාලය ලඞ් (පරස්මෛපද)

අතීතයේ කළ ක්‍රියාවක් හඟවනු පිණිස යෙදෙන ක්‍රියාපද අතීත ආඛ්‍යාත යනුවෙන් හැඳින්වේ. අතීත ආඛ්‍යාත තුන් වර්ගයක් ම සංස්කෘත භාෂාවේ භාවිත වේ.

1. **අනද්‍යතනාතීත ‘ලඞ්’** - **ඊයේ පටන් ගෙවීගිය අතීතය**
2. **භූතෙ ‘ලුඞ්’** - **නුදුරු (එදින ම සිදු වූ) අතීතය**
3. **පරොක්ෂා ‘ලිට්’** - **පෙර නොදුටු විරූ අතීතය**

සංස්කෘත භාෂාවේ බහුල ව ම යෙදෙන අතීත ලකාරය වන්නේ **අනද්‍යතනාතීත ‘ලඞ්’** ලකාර ආඛ්‍යාතයයි. ඊයේ පටන් ගෙවී ගිය කාලය තුළ සිදු කළ ක්‍රියාවක් දැක්වීමේ දී මෙම ආඛ්‍යාතය යොදනු ලබයි. (අනද්‍යතනාතීත > න + අද්‍යතන + අතීත > අද නොවූ අතීත) මෙම පාඩමේ දී ඔබේ අවධානයට යොමු කරනුයේ බහුල ව භාවිත වන **අනද්‍යතනාතීත ‘ලඞ්’** ලකාර ආඛ්‍යාතය පිළිබඳ ව පමණි.

වර්තමාන ලට්    අතීත 'ලඞ්'

गच्छति। (යයි)    अ + गच्छ + त्    अगच्छत्। - (ගියේ ය.)
पतति। (වැටෙයි)    अ + पत + त्    अपतत्। - (වැටුණේ ය.)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැඟීම

| | एक | द्वि | बहु | एक | द्वि | बहु |
|---|---|---|---|---|---|---|
| प्रथम | त् | ताम् | अन् | अपठत् | अपठताम् | अपठन् |
| मध्यम | स् (:) | तम् | त | अपठः | अपठतम् | अपठत |
| उत्तम | अम् | व | म | अपठम् | अपठाव | अपठाम |

එහි සිංහල අර්ථය

| පුරුෂ | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| ප්‍රථමපුරුෂ | පාඩම් කළේ ය | (දෙදෙන) පාඩම් කළෝ ය | පාඩම් කළෝ ය/කළහ |
| මධ්‍යමපුරුෂ | පාඩම් කළෙහි | (දෙදෙන) පාඩම් කළෙහු | පාඩම් කළෙහු |
| උත්තමපුරුෂ | පාඩම් කළෙමි | (දෙදෙන) පාඩම් කළෙමු | පාඩම් කළෙමු |

අතීතකාලය ලඞ් (ආත්මනේපද)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

| | एक | द्वि | बहु | एक | द्वि | बहु |
|---|---|---|---|---|---|---|
| प्रथम | त | एताम् | अन्त | असहत | असहेताम् | असहन्त |
| मध्यम | थाः | एथाम् | ध्वम् | असहथाः | असहेथाम् | असहध्वम् |
| उत्तम | ए | वहि | महि | असहे | असहावहि | असहावहि |

## ක්‍රියාකාරකම 02

01. පහත ක්‍රියාපද ලඞ් ලකාරයෙහි වරනගමු.

| ලට් | ලඞ් | ලට් | ලඞ් |
|---|---|---|---|
| चलति - සෙලවෙයි. | अचलत् - සෙලවුණේ ය. | पश्यति - බලයි. | अपश्यत् - බැලුවේ ය. |
| जीवति - ජීවත්වෙයි. | अजीवत् - ජීවත් වුණේ ය. | पतति - වැටෙයි. | अपतत् - වැටුනේ ය. |
| रक्षति - රකියි. | अरक्षत् - රැක්කේ ය. | पठति - හදාරයි. | अपठत् - හැදෑරුවේ ය. |
| पृच्छति - විචාරයි. | अपृच्छत् - විචාළේ ය. | मिलति - හමුවෙයි. | अमिलत् - හමුවූයේ ය. |
| क्षिपति - විසි කරයි. | आक्षिपत् - විසිකළේ ය. | चरति - හැසිරෙයි. | अचरत् - හැසුරුණේ ය. |
| कथयति - කියයි. | अकथयत् - කීවේ ය. | तिष्ठति - සිටියි. | अतिष्ठत् - සිටියේ ය. |
| क्षालयति - සෝදයි. | अक्षालयत् - සේදුවේ ය. | खादति - කයි. | अखादत् - කෑවේ ය. |
| पूजयति - පුදයි. | अपूजयत् - පිදුවේ ය. | करोति - කරයි. | अकरोत् - කළේ ය. |

## අභ්‍යාසය 06

01. පහත සඳහන් හිස්තැන්වලට අදාළ පද නිවැරැදි ව ලියන්න.

| ලට් ක්‍රියාව | වර්තමාන තේරුම | ලඞ් ක්‍රියාව | අතීත තේරුම |
|---|---|---|---|
| १. पठति | - පාඩම් කරයි. | अपठत् | - පාඩම් කළේ ය. |
| २. क्रीडन्ति | - ............... | ............... | - පාඩම් කළහ. |
| ३. तिष्ठसि | - ............... | अतिष्ठः | - ............... |
| ४. चरथः | - හැසිරෙහු. | ............... | - ............... |
| ५. निन्दामि | - ............... | ............... | - නින්දා කළෙමි. |
| ६. तुष्यतः | - දෙදෙන සතුටුවෙත්. | ............... | - ............... |
| ७. खादामः | - ............... | अखादाम | - ............... |
| ८. रक्षति | - ............... | ............... | - ආරක්ෂා කළේ ය. |
| ९. लिखन्ति | - ............... | अलिखन् | - ............... |
| १०. मुञ्चति | - මුදයි. | ............... | - ............... |
| ११. वदति | - ............... | ............... | - කීවෙහි. |
| १२. चिन्तयति | - ............... | अचिन्तयत् | - ............... |
| १३. रचयति | - රචනා කරයි. | ............... | - ............... |
| १४. पीडयति | - ............... | ............... | - පීඩා කළේ ය. |
| १५. पतावः | - දෙදෙන වැටෙමු. | ............... | - දෙදෙන වැටුනෙමු. |

## අභ්‍යාසය 07

01. ලඞ් ලකාර ආත්මනේපද ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

| | आत्मनेपद लभ् धातु | | | | आत्मनेपद वृध् धातु | | |
|---|---|---|---|---|---|---|---|
| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | | एकवचन | द्विवचन | बहुवचन |
| प्रथमपुरुष | अलभत | | अलभन्त | | अवर्धत | अवर्धेताम् | |
| मध्यमपुरुष | | अलभथाम् | | | | अवर्धेथाम् | अवर्धध्वम् |
| उत्तमपुरुष | अलभे | | अलभामहि | | अवर्धे | | अवर्धामहि |

## අභ්‍යාසය 08

01. ලඞ් ලකාර ආත්මනේපද ක්‍රියාරූපවලින් වාක්‍ය සම්පූර්ණ කරන්න.

१. त्वं बुद्धं ............. । वन्द् (ඔබ බුදුන් වැන්දෙහි.)

२. अहं सुभाषितम् ............. । भाष् (මම යහපත් වචන කීවෙමි.)

३. भक्तः बुद्धम् ............. । वन्द् (බැතිමතා බුදුන් වැන්දේ ය.)

४. आवां भारम् ............. । वह् (අපි දෙදෙනා බර ඉසලුවෙමු.)

५. अध्यापकः छात्रम् ............. । श्लाघ् । (ගුරුවරයා ශිෂ්‍යයා පැසසුවේ ය.)

६. वयं सत्पुरुषान् ............. । सेव् (අපි සත්පුරුෂයන් ඇසුරු කළෙමු.)

७. युवाम् उपहारम् ............. । लभ् (ඔබලා දෙදෙනා උපහාර ලැබුවෙහු.)

८. युवां साधून् ............. । सेव् (නුඹලා සත්පුරුෂයන් ඇසුරු කළෙහු.)

९. सज्जनाः जनान् ............. । सेव् (සත්පුරුෂයෝ ජනයන් ඇසුරු කළහ.)

१०. याचकौ धनम् ............. । याच् (යාචකයෝ දෙදෙනා ධනය ඉල්ලුවෝ ය.)

## ක්‍රියාකාරකම 03

01. සෝපසර්ග ධාතුවලින් සැදුණු අතීත කාලික ක්‍රියා කිහිපයක් පහත දැක්වේ. ඒවා හොඳින් අධ්‍යයනය කරන්න.

अति + क्रामति - अतिक्रामति - ඉක්මවායයි > अति + अक्रामत् - अत्यक्रामत् - ඉක්මවාගියේ ය.

अधि + गच्छति - अधिगच्छति - ලබයි > अधि + अगच्छत् - अध्यगच्छत् - ලැබුවේ ය.

अनु + सरति - अनुसरति - ලුහුබඳියි > अनु + असरत् - अन्वसरत् - ලුහුබැන්දේ ය.

अप + नयति - अपनयति - බැහැර ගෙනයයි > अप + अनयत् - अपानयत् - බැහැර ගෙනගියේ ය.

अव + तरति - अवतरति - බසියි > अव + अतरत् - अवातरत् - බැස්සේ ය.

आ + नयति - आनयति - ගෙන එයි > आ + अनयत् - आनयत् - ගෙන ආයේ ය.

उत् + गच्छति - उद्गच्छति - පැනනගියි > उत् + अगच्छत् - उदगच्छत् - පැනනැග්ගේ ය.

उप + गच्छति - उपगच्छति - ළංවෙයි > उप + अगच्छत् - उपागच्छत् - ළංවූයේ ය.

निर् + गच्छति - निर्गच्छति - නික්මෙයි > निर् + अगच्छत् - निरगच्छत् - නික්මුණේ ය.

प्रति + गच्छति - प्रतिगच्छति - වෙතට යයි > प्रति + अगच्छत् - प्रत्यगच्छत् - වෙතට ගියේ ය.

प्र + यच्छति - प्रयच्छति - දෙයි > प्र + अयच्छत् - प्रायच्छत् - දුන්නේ ය.

परा + जयति - पराजयति - පරදියි > परा + अजयत् -पराजयत् - පැරදුණේ ය.

सम् + गच्छति - संगच्छति - එකතුවෙයි > सम् + अगच्छत् -समगच्छत् - එකතු විය.

अनु + भवति - अनुभवति - විඳියි > अनु + अभवत् - अन्वभवत् - වින්දේ ය.

अव + रोहति - अवरोहति - බසියි > अव + अरोहत् - अवारोहत् - බැස්සේ ය

## අභ්‍යාසය 09

01. පහත දැක්වෙන වාක්‍යවල ඇති හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරන්න. තේරුම ලියන්න.

०९. अहं पोतेन गङ्गा ............... (तरामः / तरामि / तरावः)

०२. कर्षकौ क्षेत्रे बीजानि ............... (वपतः/ वपथः /वपन्ति)

०३. वयं प्रातः बुद्धं ............... (नमामि / नमथः / नमामः)

०४. त्वं देवस्य रूपं ............... (पश्यति / पश्यसि / पश्यामि)

०५. श्रमणाः नूनं सत्यं ............... (वदन्ति / वदतः / वदामः)

०६. सर्पः दारकस्य पादं ............... (दशसि / दशामि / दशति)

०७. यूयं नित्यं सज्जनान् ............... (भजामः / भजथः / भजथ)

०८. गायकौ मधुरं गीतानि ............... (गायतः / गायथः / गायथ)

०९. अग्रजा उद्याने पुष्पाणि ............... (जिघ्रन्ति / जिघ्रति / जिघ्रतः)

१०. वयं सदैव प्रातः गुरून् ............... (अर्चयामः / अर्चयामि / अर्चयावः)

११. पितामहस्य व्याधिः मन्दं ............... (शाम्यतः / शाम्यन्ति / शाम्यति)

१२. सर्पः जलं पातुं गत्वा कूपे ............... (अपतन् / अपतत् / अपताम्)

१३. अहं गुरुणा सार्धं विहारं ............... (अगच्छम् / अगच्छावः/ अगच्छामः)

१४. श्रावकाः शालायां निषद्य धर्मं ............... (शृण्वन्ति / शृण्वतः / शृण्वत्)

१५. आवां अध्ययनाय पाठालयं ............... (विशावः / विशामः / विशथः)

१६. मृगाः मनुष्यान् दृष्ट्वा शीघ्रं .............. (अधावत् / अधावम् / अधावन्)

१७. युवां पठनेन विना परीक्षणात् समर्थाय कथं .............. (शक्नुथ / शक्नुथः / शक्नुतः)

१८. पूर्वे सर्वज्ञः लङ्कां प्राप्य यक्षेभ्यः धर्मं ............... (अदेशयति / अदेशयत् / अदेशयत)

१९. छात्रः स्व कक्ष्यायां पीठानि च उत्पीठिकाश्च .............. (गणयति / गणयतः / गणयन्ति)

२०. तस्कराः रात्रौ गृहान् प्रविश्य भण्डानि ............... (अमुष्णोन्/ अमुष्णात्/ अमुष्णोताम्)

## ක්‍රියාකාරකම 04

01. පහත සඳහන් කථාව හඬනගා සාවධාන ව කියවන්න. තේරුම් ගන්න.

### दशमः त्वम् असि ।

एकदा दशबालकाः स्नानाय नदीम् अगच्छन्। ते नदीजले चिरं स्नानम् अकुर्वन्। ततः ते तीर्त्वा पारं गताः। तदा तेषां नायकः अपृच्छत्-अपि सर्वे बालकाः नदीम् उत्तीर्णाः ? तदा कश्चिद्बालकः अगणयत् - एकः, द्वौ, त्रयः, चत्वारः, पञ्च, षट्, सप्त, अष्टौ, नव इति। सः स्वं न अगणयत्। अतः स अवदत्-नव एव सन्ति। दशमः न अस्ति। अपरः अपि बालकः पुनः अन्यान् बालकान् अगणयत्। तदा अपि नव एव आसन्। अतः ते निश्चयम् अकुर्वन् यत् दशमः नद्यां मग्नः। ते दुःखिताः तूष्णीम् अतिष्ठन्। तदा कश्चित् पथिकः तत्र आगच्छत्। स तान् बालकान् दुःखितान् दृष्ट्वा अपृच्छत्- बालकाः ! युष्माकं दुःखस्य कारणं किम् ? बालकानां नायकः अकथयत्। ‘ वयं दश बालकाः स्नातुम् आगताः। इदानीं नव एव स्मः। एकः नद्यां मग्नः’ इति।

पथिकः तान् अगणयत्। तत्र दशबालकाः एव आसन्। सः नायकम् आदिशत् । त्वं बालकान् गणय। स तु नवबालकान् एव अगणयत्। तदा पथिकः अवदत् - दशमः त्वम् असि इति। तत् श्रुत्वा प्रहृष्टाः भूत्वा सर्वे गृहम् अगच्छन्।

## අභ්‍යාසය 10

01. කථාවේ ඇතුළත් වර්ණ ගන්වන ලද ක්‍රියාපදවල ලකාරය, පුරුෂය, වචනය හා තේරුම ලියන්න.

ශබ්දාර්ථ

| | |
|---|---|
| **पोतेन** | - (හබලෙන්) |
| **तस्करः** | - (සොරා) |
| **पितामहः** | - (සීයා) |
| **कूपम्** | - (ළිඳ) |
| **अग्रजा** | - (වැඩිමහල් සහෝදරිය) |
| **उत्पीठिका** | - (මේසය) |

**कामं व्यसनवृक्षस्य मूलं दुर्जनसंगतिः।**

කාමං ව්‍යසනවෘක්ෂස්‍ය මූලං දුර්ජනසංගතිඃ

දුදනන් හා එක්වීම ඒකාන්තයෙන් විපත් නැමති ගසේ මුලයි.

**क्षीणा नरा निष्करुणा भवन्ति।**

ක්ෂීණා නරා නිෂ්කරුණා භවන්ති

පිරිහුණු පුද්ගලයෝ අකාරුණික වෙත්.

**क्षारं पिबति पयोधेर्वर्षत्यम्भोधरो मधुरम्भः।**

ක්ෂාරං පිබති පයොධේර්වර්ෂත්‍යම්භෝධරෝ මධුරම්භඃ.

වළාකුළ, මුහුදෙන් ලුණු දිය බී මිහිරි ජලය ලබා දෙයි.